# පරිශිෂ්ටයන්

## පළමුවැනි පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍ය සභාව විසින් 1977 දී පනවන ලද ප්‍රධාන නීතිවලින් උපුටා ගත්, මහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.**



| | පිටුව |
|---|---|
| 1. 1977 අංක 4 දරන විනිමය පාලන (සංශෝධන) පනත | (i) |
| 2. 1977 අංක 12 දරන අපරාධ යුක්ති කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත | (i) |
| 3. 1977 අංක 13 දරන විනිමය පාලන (සංශෝධන) පනත | (i) |
| 4. 1977 අංක 16 දරන මුදල් නීති (සංශෝධන) පනත | (ii) |
| 5. 1977 අංක 17 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර (ඉවත් කිරීමේ) පනත | (iv) |
| 6. 1977 අංක 25 දරන විසර්ජන පනත | (vii) |

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 4 දරන විනිමය පාලන (සංශෝධන) පනත

**විනිමය පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 4 දරන විනිමය පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1972 අංක 14 දරන පනතින් සංශෝධිත විනිමය පාලන පනත, එහි 30ආ වන වගන්තිය සංශෝධනය කිරීමෙන් එම පනත, පහත දක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''ඒ තැනැත්තා සිරභාරයේ සිටින පරිපාලන දිස්ත්‍රික්කයේ'' යන වචන අත්හැරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (5) වන සහ (6) වන උපවගන්තිවල ''අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්'' යන වචන එම උප වගන්තිවල සඳහන් ව ඇති කවර තැනක වුව ද ඒ වෙනුවට ''රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්'' යන වචන ආදේශ කිරීමෙන්.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 12 දරන අපරාධ යුක්ති කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත

**1972 අංක 14 දරන අපරාධ යුක්ති කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාත් වූ පනතකි**

1 මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 12 දරන අපරාධ යුක්ති කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1972 අංක 14 දරන අපරාධ යුක්ති කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ අනුව, අපරාධ යුක්ති කොමිෂන් සභාවක් පිහිටුවන සෑම බලපත්‍රයක් ම නීතියෙහි ලා වලංගුවීම හා කිසිදු බලපැවැත්මකින් යුක්තවීම නතර වන්නේ ය. තව ද, එකී යම් කොමිෂන් සභාවක් ඉදිරියේ විනිශ්චයට භාජනව ඇති යම් නඩු කටයුත්තක්, කාරණයක් හෝ දෙයක්, අවසාන වීමෙන් හෝ එයට ආනුෂංගික වශයෙන් පැන නැඟෙන යම් ආඥාවක් කිරීමට එම කොමිෂන් සභාවේ අධිකරණ බලයට යටත්ව ඒ නඩු කටයුත්ත, කාරණය හෝ දෙය, මෙම පනත ක්‍රියාත්මක වූ විට අවසාන වන්නේ ය.

3. යම් අපරාධ යුක්ති කොමිෂන් සභාවක් ඉදිරියේ විනිශ්චයට භාජනව ඇති යම් නඩු කටයුත්තක්, කාරණයක් හෝ දෙයක් අවසාන වීම තත්කාලයේ බලපවත්නා නීතිය අනුව යම් අධිකරණයක ඒ නඩු කටයුත්ත, කාරණය හෝ දෙය සම්බන්ධයෙන් යම් අපරාධ නඩුවක් හෝ නඩුවක් පැවරීමේ අයිතිවාසිකම කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 13 දරන විනිමය පාලන (සංශෝධන) පනත

**විනිමය පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 13 දරන විනිමය පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 14 දරන පනතින් ඇතුළු කරන ලද) විනිමය පාලන පනතේ Vආ වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

# ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 16 දරන මුදල් නීති (සංශෝධන) පනත

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 16 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පහත දැක්වෙන අලුත් වගන්තිය 76 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 76අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

76අ. (1) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වන විදේශ ව්‍යවහාර මුදල් වල ශ්‍රී ලංකාවේ රුපියල සම්බන්ධයෙන් වූ සමකයන්, 73 වන වගන්තියට අනුකූලව නිශ්චය කිරීම හා සහතික කිරීම අවස්ථානුකූල නොවන බව අධිපතිගේ මතය වන අවස්ථාවක, ඒ වගන්තිය යටතේ එම සමකයන් නිශ්චය කිරීම හා සහතික කිරීම වෙනුවට මහ බැංකුව විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගතහැකි හා විකිණිය හැකි ප්‍රමාණයන් ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(2) මහ බැංකුව විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගත හැකි හා විකිණිය හැකි ප්‍රමාණයන් (1) වන උපවගන්තිය යටතේ අධිපති විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, 73 වන, 74 වන සහ 76 වන වගන්තිවල විධිවිධාන නීතියෙහි ලා කිසිම බලපෑමක් හෝ වලංගු භාවයක් තිබීම අවසන් විය යුතු අතර පහත දැක්වෙන විධිවිධාන ඒ නිශ්චය කිරීමෙහි ලා අදාළ විය යුතු ය:—

(අ) ඒ නිශ්චය කිරීම අධිපති විසින් උචිත යයි සලකනු ලබන විදේශ ව්‍යවහාර මුදල් සඳහා සීමා කරනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද ප්‍රමාණයන් විදේශ මුදල් නෝට්ටු හා කාසි මිලට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු අතර එවැනි අවස්ථාවන්හි දී ඒ මිලට ගැනීම් වල හා විකිණීම්වල අතිරේක ගාස්තු හෝ ඒ මිලට ගැනීම්වලට හා විකිණීම්වලට ආනුෂංගික ගාස්තු කෙරෙහි මහ බැංකුව සැලකිලිමත් විය හැකි ය.

(ඇ) එක් එක් වර්ගයේ ගනුදෙනු සම්බන්ධයෙන් වූ අතිරේක ගාස්තු වියදම් හෝ අවදානම් සඳහා මහ බැංකුව වෙත ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය වන තාක් ප්‍රමාණය හැර, ඒක්ෂණ ගනුදෙනු නොවන ගනුදෙනු සඳහා වූ ප්‍රමාණයන් (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන ප්‍රමාණයන්ගෙන් වෙනස් නොවිය යුතු ය.

(ඈ) විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන් ම දරනු ලැබූ විදුලි පණිවුඩ ගාස්තු හෝ වෙනත් ගාස්තු හැර, ඒ මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් කොමිස් මුදලක් භාර ගැනීම හෝ කවර හෝ විස්තරයක ගාස්තුවක් පැනවීම හෝ මහ බැංකුව විසින් නොකළ යුතු ය.

(ඉ) (1) වන උපවගන්තිය යටතේ අධිපති විසින් නිශ්චය කරන ලද ප්‍රමාණයන් කලින් කල සහ අධිපති විසින් දක්වනු ලබන සීමා ඇතුළත වෙනස් කිරීම පිණිස නමින් හෝ නිලයෙන් යම් නිලධරයකුට ලියවිල්ලකින් බලය දීමට අධිපතිට බලය ඇත්තේ ය.

(ඊ) යම් විදේශ ව්‍යවහාර මුදලක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ අධිපති විසින් කිසිම නිශ්චයක් නොකරනු ලබන අවස්ථාවක වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලක් වෙනුවෙන් අධිපති විසින් (1) වන උපවගන්තිය යටතේ නිශ්චයක් කරනු ලබුවේද ඒ සම්බන්ධයෙන් ජාත්‍යාන්තර වෙළෙඳපලවල ඒ ව්‍යවහාර මුදල සඳහා විනිමය ප්‍රමාණයේ පදනම මත ආගණනය කරනු ලැබූ ප්‍රමාණයක් අනුව එම ව්‍යවහාර මුදල් මිලට ගැනීම් හා විකිණීම මහ බැංකුව විසින් කළ හැකි ය.

(උ) (i) මහ බැංකුව විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම කරනු ලැබිය හැකි ප්‍රමාණයන් (1) වන උපවගන්තිය යටතේ අධිපති විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, යම් වාණිජ බැංකුවක් විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගනු ලැබිය හැකි අවම ප්‍රමාණය සහ යම් වාණිජ බැංකුවක් විසින් ඒක්ෂණ විදේශ විනිමය විකුණනු ලැබිය හැකි උපරිම ප්‍රමාණය ද ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(ii) (ඊ) ඡේදයෙන් දෙන ලද බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා මහ බැංකුව විසින් යම් ව්‍යවහාර මුදලක් මිලට ගනු ලබන හෝ විකුණනු ලබන කවර හෝ අවස්ථාවක දී යම් වාණිජ බැංකුවක් විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගනු ලැබිය හැකි අවම ප්‍රමාණය සහ යම් වානිජ බැංකුවක් විසින් ඒක්ෂණ විදේශ විනිමය විකුණනු ලැබිය හැකි උපරිම ප්‍රමාණය අධිපති විසින් ඒ සඳහා නමින් හෝ නිලයෙන් බලය දෙනු ලබන යම් නිලධරයකු විසින් කරනු ලැබිය හැකි ය.

(iii) මේ ඡේදය යටතේ නිශ්චය කරනු ලැබූ අවම හා උපරිම ප්‍රමාණයන් කෙරෙහි හා සම්බන්ධයෙන් (ඉ) ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතු ය.

(ඌ) යම් විදේශ ව්‍යවහාර මුදලක් වෙනුවෙන් (උ) ඡේදය යටතේ කිසිම නිශ්චයක් නොකරනු ලැබ ඇති අවස්ථාවක, ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි ඒ ව්‍යවහාර මුදල සඳහා වූ විනිමය ප්‍රමාණයේ පදනම මත ආගණනය කරනු ලැබූ ප්‍රමාණයන් අනුව, යම් වානිජ බැංකුවක් විසින් එම ව්‍යවහාර මුදල් මිලට ගැනීම, විකිණීම හෝ යම් ගනුදෙනුවක් පවත්වා ගෙන යාම හෝ කරනු ලැබිය හැකි ය.

(එ) වාණිජ බැංකු විසින් ඒක්ෂණ විදේශ විනිමය මිලට ගනු ලැබිය හැකි හා විකිණිය හැකි අවම සහ උපරිම ප්‍රමාණයන් පිළිබඳව අධිපති විසින් (උ) ඡේදය යටතේ නිශ්චයක් කරනු ලබන අවස්ථාවක—

(i) කිසිම වාණිජ බැංකුවක් විසින්, එම ඡේදය යටතේ නිශ්චය කරන ලද අවම ප්‍රමාණයට අඩු යම් ප්‍රමාණයක් අනුව ඒක්ෂණ විදේශ විනිමය මිලට ගැනීම හෝ එසේ නිශ්චය කරන ලද උපරිම ප්‍රමාණය ඉක්ම වන්නා වූ යම් ප්‍රමාණයක් අනුව ඒක්ෂණ විදේශ විනිමය විකිණීම හෝ නොකළ යුතු ය; තව ද, එම විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන් ම දරනු ලැබූ විදුලි පණිවුඩ ගාස්තු හෝ වෙනත් ගාස්තු හැර, ඒ මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් කොමිස් මුදලක් භාර ගැනීම හෝ කවර හෝ විස්තරයක යම් ගාස්තුවක් පැනවීම හෝ කිසිම වාණිජ බැංකුවක් විසින් නොකළ යුතු ය.

(ii) (උ) ඡේදය යටතේ නිශ්චය කරන ලද ප්‍රමාණයන්ගෙන් අතිරේක ගාස්තු, වියදම් හෝ ගනුදෙනුවේ අවදනම ගැන සැලකිලිමත්ව සාධාරණ සීමාවකින් වැඩි වූ සීමාවකින් හෝ අධිපති විසින් ඒ සඳහා නියම කරනු ලැබිය හැකි යම් සීමාවක් වෙතොත් ඒ සීමාවෙන් වෙනස් වන්නා වූ යම් ප්‍රමාණයක් අනුව ඒක්ෂණ ගනුදෙනුවක් නොවන්නා වූ යම් විනිමය ගනුදෙනුවක් කිසිම වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(ඒ) අවම සහ උපරිම ප්‍රමාණයන් සම්බන්ධයෙන් (උ) ඡේදය යටතේ වූ නිශ්චය කිරීමක්, මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීම 72 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් අත්හිටවනු ලබන හෝ සීමා කරනු ලබන යම් කාලසීමාවක් තුළ දී අදාළ නොවිය යුතු ය.''

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 යන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) 76අ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමක හේතුවෙන් 73 වන, 74 වන සහ 76 වන වගන්ති වල විධිවිධාන බලරහිත වන හෝ පලදායි නොවන අවස්ථාවක මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන ද බලරහිත වන අතර පලදායි ද නොවිය යුතු ය; තව ද ඒ අනුව යම් බැංකු ආයතනයක් විසින් ලබා ගන්නා ලද යම් නැවත අගය කිරීමේ ලාභ හෝ දරන ලද යම් නැවත අගය කිරීමේ අලාභ මහ බැංකුව විසින් භාර නොගත යුතු ය.''.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 17 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර (ඉවත් කිරීමේ) පනත

**1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත ඉවත් කිරීම පිණිස සහ ඇතැම් ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 17 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර (ඉවත් කිරීමේ) පනත යනු වෙන් හඳුන්වනු ලැබේ.

2. (1) 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත ඉවත් කළ ද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර මිලට ගැනීම හෝ විකිණීම සඳහා හෝ, විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සඳහා හෝ යම් ගිවිසුමකට එළඹෙන තැනැත්තකුට ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර මිලට ගැනීමට හිමිකම හෝ නියමිතව හෝ තිබෙන අවස්ථාවක ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය සහතික පත්‍ර මිලට ගැනීම හෝ විකිණීම හා විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සඳහා යම් වාණිජ බැංකුවක් සමඟ ඇතුළත්ව ඇත්තාවූ ද, 1977 නොවැම්බර් මස 15/16 මධ්‍යම රාත්‍රියේ දී ඉෂ්ට කර නොමැත්තාවූ ද සෑම ගිවිසුමක් ම සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතුය:-

(අ) වාණිජ බැංකුවක් සමග, විදේශ විනිමය විකිණීම සඳහා වූ ගිවිසුමකට සහ එම ගනුදෙනුව සම්බන්ධයෙන් ම විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා වූ ගිවිසුමකට යම් තැනැත්තකු ඇතුළත්ව සිටින අවස්ථාවක, විදේශ විනිමය විකිණීම සඳහා එම ගිවිසුමෙහි නිශ්චිත විනිමය අනුපාතය අනුව ගණන් බලන ලද මුදලක් සහ, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ගිවිසුමෙහි නිශ්චිත අනුපාතය අනුව ගණන් බලන ලද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ලබා ගැනීමේ හිමිකම එම තැනැත්තාට තිබිය යුතුය;

(ආ) යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විදේශ විනිමය විකිණීම සඳහා වාණිජ බැංකුවක් සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති නමුත්, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර තමා වෙත නිකුත් කරනු ලැබීමට හිමිකම් තිබුණු ගනුදෙනුවක් වන ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය සහතික පත්‍ර නිකුත් කරනු ලැබීම සඳහා ඔහු ගිවිසුමකට ඇතුළත්ව නොමැති අවස්ථාවක, ඒ ගිවිසුමෙහි නිශ්චිත විනිමය අනුපාතය අනුව ගණන් බලන ලද මුදලක් සහ එම ගිවිසුමෙහි දිනයෙහි දී පැවති අනුපාතය අනුව ගණන් බලන ලද ඒ තැනැත්තාට හිමිකම් ලැබිය හැකිව තිබුණු විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් පමණක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ලබා ගැනීමේ හිමිකම එම තැනැත්තාට තිබිය යුතුය;

(ඇ) වාණිජ බැංකුවක් සමග, යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ගිවිසුමකට යම් තැනැත්තකු ඇතුළත්ව ඇති නමුත්, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය විකිණීම සඳහා ගිවිසුමකට ඔහු ඇතුළත්ව නොමැති අවස්ථාවක, ඔහු එම ගිවිසුමට ඇතුළත් වූයේ යම් දිනයක ද ඒ දිනයේ දී පැවති විනිමය අනුපාතය අනුව ගණන් බලන ලද මුදලක් සහ ගිවිසුමෙහි නිශ්චිත අනුපාතය මත ගණන් බලන කද, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් පමණක් ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ලබා ගැනීමේ හිමිකම එම තැනැත්තාට තිබිය යුතුය;

(ඈ) වාණිජ බැංකුවක් සමග විදේශ විනිමය මිලට ගැනීම සඳහා වූ ගිවිසුමකට සහ, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ම විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා වූ ගිවිසුමකට යම් තැනැත්තකු ඇතුලත්ව ඇති අවස්ථාවක, විදේශ විනිමය මිලට ගැනීම සඳහා වූ ගිවිසුමෙහි නිශ්චිත අනුපාතයට අනුව ගණන් බලන ලද විදේශ විනිමය මිලට ගැනීම සඳහා ඔහුට හිමිකම තිබිය යුතු අතර, එසේ මිලට ගතහොත් එම මිලට අමතරව, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා වූ ගිවිසුමෙහි නිශ්චිත විනිමය අනුපාතය අනුව ගණන් බලන ලද, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් ගෙවීමට එහුට නියම වන්නේ ය:

(ඉ) යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් විදේශ විනිමය මිලට ගැනීම සඳහා වාණිජ බැංකුවක් සමග යම් තැනැත්තකු ගිවිසුමකට ඇතුලත්ව ඇති නමුත් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර භාරදීම අවශ්‍ය වන ගනුදෙනුවක් වන ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ගිවිසුමකට ඔහු ඇතුළත්ව නොමැති අවස්ථාවක, ඒ ගිවිසුමෙහි නිශ්චිත අනුපාතය අනුව විදේශ විනිමය මිලට ගැනීමේ හිමිකම ඔහුට තිබිය යුතුය එසේ වුව ද ඒ මිලට අමතරව, ඒ ගිවිසුමෙහි දිනයෙහි පැවැති අනුපාතය අනුව ගණන් බලන ලද, විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා යම් වාණිජ බැංකුවක් සමග යම් තැනැත්තෙකු ගිවිසුමකට ඇතුළත්ව ඇති නමුත් ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් විදේශ විනිමය මිලට ගැනීම සඳහා ගිවිසුමකට ඔහු ඇතුළත්ව නොමැති අවස්ථාවක, ඒ ගිවිසුමෙහි සඳහන් අනුපාතයට අනුව ගණන් බලන ලද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රවල වටිනාකමට සමාන මුදලක් ඔහු ගෙවන්නේ නම්, ගිවිසුමට ඔහු ඇතුළත් වූයේ යම් දිනයක ද ඒ දිනයේ දී පැවති විනිමය අනුපාතය අනුව ගණන් බලන ලද විදේශ විනිමය ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් මිලට ගැනීමේ හිමිකම ඔහුට තිබිය යුතු ය.

(3) (අ) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් උද්ගත වන; හෝ

(ආ) 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත ඉවත් කිරීම නිසා නොවේ නම්, ඒ පනත යටතේ පිහිටුවන ලද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ගිණුමට හෝ ගිණුමෙන් ගෙවිය යුතු සියලු ලාභ සහ අලාභ, හා ලැබීම් සහ ගෙවීම් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය; නැතහොත් ඒ අරමුදලට වැය බරක් විය යුතු ය.

3. (1) 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත ඉවත් කිරීමේ හේතුවෙන් මේ පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන සලසා නොමැති යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට යම් දුෂ්කරතාවක් ඇති වන අවස්ථාවක, අවස්ථාගත කරුණු අනුව සාධාරණ යයි සහ යුක්තිසහගත යයි අධිපති සලකන විධාන ඔහු විසින් යම් වාණිජ බැංකුවක් වෙත නිකුත් කිරීම බලසහිත වන්නේ ය;

එසේ වුව ද පීඩාවට පත් තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා විසින් 1978 ජනවාරි මස 1 වන දිනට පෙර අධිපති වෙත සහනය සඳහා ඉල්ලීමක් කරනු ලැබුවහොත් මිස, එදින හෝ ඉන් පසුව එවැනි යම් විධානයක් නිකුත් කරනු ලැබීමට අධිපතිට බලය නොමැත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුව ගෙවන ලද යම් මුදලක් ඒකාබද්ධ අරමුදලෙහි වැය බරක් විය යුතු ය.

4. මේ පනතේ ප්‍රතිපත්ති පවත්වාගෙන යාමේ සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, වාණිජ බැංකු, බලයලත් වෙළෙන්දන්, අනුමත ප්‍රතිග්‍රාහකයන් සහ වෙනත් තැනැත්තන් වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

''වාණිජ බැංකුව'' යන්නට මුදල් නීති පනතේ 127 (1) වන වගන්තියෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය;

''විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රය'' යන්නෙන් 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත යටතේ මහ බැංකුව විසින් හෝ මහ බැංකුව සඳහා හෝ මහ බැංකුව වෙනුවෙන් හෝ නිකුත් කරන ලද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රයක් අදහස් වේ;

''අධිපති'' යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අදහස් වන අතර ඊට නියෝජ්‍ය අධිපතිවරයෙක් ද ඇතුළත් වේ.

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 25 දරන විසර්ජන පනත

**1978 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත් ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 25 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1978 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1978 ජනවාරි 1 වන දිනයෙන් ආරම්භව 1978 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් එක් දහස් තුන්සිය පනස් හය කෝටි දෙලක්ෂ හැටපන්දහස් එකසිය දෙළහක් වූ ආණ්ඩුවේ වියදම -

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින්; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් පන්සිය පසළොස් කෝටි පනස් ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් එක් දහස් තුන්සිය පනස් හය කෝටි දෙලක්ෂ හැටපන්දහස් එකසිය දෙළහක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන් කිසි ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

3. (1) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන එක් එක් කටයුත්තෙන් 2 වන වගන්තියෙහි සඳහන් මුදල් වර්ෂය තුළ දී ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු ය. එහෙත්, එසේ බැර කරනු ලබන ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතු ය. එවැනි කටයුත්තකින් ඒ උපරිම සීමාව ඉක්මවා ලැබෙන ලැබීම් කිසිවක් වෙතොත් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නො ඉක්මවිය යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන කිසි යම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තව ද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් එම උපලේඛනයේ V වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන යම් කට යුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කළ හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසි යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් කිසි වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මෙම පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද යම් මුදලක් එම වැඩ සටහනේ ම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභව යන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට,

අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුද හරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කළ හැකි ය.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයේ, III වන තීරයේ, IV වන තීරයේ හෝ V වන තීරයේ දක්වෙන යම් උපරිම සීමාවක් ආණ්ඩුවේ අනුමතය ඇතිව 1979 ජූලි 31 වන දින හෝ ඊට පෙර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් වෙනස් කළ හැකිය නැත හොත් අමුතු කළ හැකිය. එබඳු යම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව ම සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත් වූ ලෙස සැලකිය යුතු ය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කට යුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් එකතු කිරීමෙන් ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත යෝජනාවක් මගින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.